# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# විශ්වවිද්‍යාලය ප්‍රවේශය
# 2019/2020 අධ්‍යයන වර්ෂය

## සාමාන්‍ය ප්‍රවේශය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (අභ්‍යන්තර) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා **2017** වර්ෂයේ පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි හා ප්‍රාචීන මධ්‍යම විභාගයට පෙනී සිටි පහත සඳහන් සුදුසුකම් ලබා ගත් වයස **අවුරුදු 28ට අඩු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගෙන් සහ ගිහි පිරිමි සිසුන්ගෙන් 2019/03/29** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### බඳවා ගන්නා ආකාරය:

2017 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලබා ගත් Z ලකුණුවල (Z Score) ප්‍රමුඛතාව සහ ප්‍රාචීන මධ්‍යම විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයට ලක් කොට බඳවා ගනු ලැබේ.

### ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම්:

1. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී බෞද්ධ විෂය ක්ෂේත්‍රයේ විෂයක් (බෞද්ධ ශිෂ්ටාචාරය/බුද්ධධර්මය) හා පාලි විෂය සහිත ව විෂයන් තුනකින් සමත් වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට ලකුණු 30%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.

   හෝ

2. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සංස්කෘත හෝ ඉතිහාසය හෝ සිංහල සහ පාලි විෂය සහිත ව විෂයන් තුනකින් සමත් වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.

   හෝ

3. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී පාලි විෂයට පෙනී නොසිටියේ නම් අ.පො.ස. (උ.පෙළ) බෞද්ධ විෂයක් (බෞද්ධ ශිෂ්ටාචාරය/බුද්ධධර්මය) සහ භාෂා විෂයක් සහිත ව විෂයන් තුනකින් සමත් වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම සහ පාලි විෂය පිළිබඳ අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම්වලින් එකක් වත් සපුරා තිබීම.

   I. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයේ පාලි විෂය සමත් වීම.
   II. මූලික පිරිවෙන් අවසාන විභාගයේ පාලි විෂය සමත් වීම.

III. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ පාලි විෂය සමත් වීම.

IV. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පාලි ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වීම.

V. බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් වීම.

හෝ

4. ප්‍රාචීන මධ්‍යම විභාගය සමඟ නියමිත වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) සමත්වීම සහ සමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට ලකුණු 30ක් ලබා තිබීම.

## සංස්කෘත විශේෂ ප්‍රවේශය

විශ්වවිද්‍යාලය තුළ සංස්කෘත පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් උනන්දු කරවීම අරමුණු කොට ඉහත සඳහන් වර්ෂයේ පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සංස්කෘත විෂයට සාමර්ථ්‍යයක් සහිත ව අදාළ ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍යයන්ගෙන් ද සීමිත සංඛ්‍යාවක් සංස්කෘත විෂය අනිවාර්ය කොට විශ්වවිද්‍යාලයට බඳවා ගනු ලැබේ. සංස්කෘත විෂය අනිවාර්ය කර බඳවා ගත් සිසුන් තම අධ්‍යයන කාලය තුළ සාමාන්‍යවේදී හෝ විශේෂවේදී පාඨමාලා සඳහා එම විෂය ම හැදෑරිය යුතු ය. එම කාලය තුළ වෙනත් පාඨමාලාවලට මාරු කරනු නොලැබේ.

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරයඃ**

- **වෙබ් අඩවිය මගින්ඃ**

අයදුම්පත හා අදාළ විස්තර www.bpu.ac.lk යන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි ය. වෙබ් අඩවිය මගින් ලබා ගන්නා අයදුම්පත සම්පූර්ණ කර **ඒ සමග හෝමාගම ලංකා බැංකු ශාඛාවේ, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ගිණුම් අංක 7112010ට බැර වන පරිදි රු. 500.00ක් ගෙවා ලබා ගන්නා ලද බැංකු කුවිතාන්සිය අමුණා** ලියාපදිංචි තැපෑලෙන් 2019/03/29 දිනට පෙර පහත ලිපිනයට එවිය යුතු ය.

සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා),<br>
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,<br>
ගුරුළුගෝමී මාවත,<br>
පිටිපන උතුර, හෝමාගම.<br>
දුරකථන අංකය ඃ-011-2857786, 011-2891104

- **තැපැල් මගින්ඃ**

තැපැල් මගින් අයදුම්පත් ලබා ගන්නේ නම්, හෝමාගම ලංකා බැංකු ශාඛාවේ, **ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ගිණුම් අංක 7112010ට බැර වන පරිදි රු. 500.00ක් ගෙවා ලබා ගන්නා ලද බැංකු කුවිතාන්සිය සමග 10" x 7" ප්‍රමාණයේ තම නම සහ ලිපිනය ලියන ලද රු. 45.00ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමඟ** 2019/03/20 දිනට පෙර ලැබෙන සේ එවිය යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලබා ගැනීම

සඳහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**විශ්වවිද්‍යාලය ප්‍රවේශය - 2019/2020**'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

- **පැමිණ ලබා ගැනීම:**

අයදුම්පත් හා අදාළ විස්තර **ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැඟිල්ලේ දී සතියේ වැඩ කරන දිනවල ප.ව. 3.00ට පෙර 2019/03/28** දින දක්වා පැමිණ ලබා ගත හැකි ය.

අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයෙන් පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019/03/29 දිනට පෙර **ඉහත** සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**විශ්වවිද්‍යාලය ප්‍රවේශය - 2019/2020**'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

සැ.යු. ඃ- **විශ්වවිද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට සහ උපාධි ප්‍රදානයට අදාළ නීතිරීතිවලට යටත් ව සිසුන් ලියාපදිංචි කරන බව ද, පැවිදි ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචිය ලබා ගත් පසු උපැවිදි වුවහොත් ශිෂ්‍ය භාවය හා ඊට හිමි සියලු වරප්‍රසාද අහිමි වන බව ද, පැවිදි ශිෂ්‍යයකු උපාධි ප්‍රදානෝත්සවයට ප්‍රථම උපැවිදි වුවහොත් අනුපස්ථිතියෙහි පමණක් අදාළ උපාධිය ප්‍රදානය කරනු ලබන බව ද පැවිදි නමින් පමණක් උපාධි සහතිකය ප්‍රදානය කරනු ලබන බව ද සැලකිය යුතු ය.**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
පිටිපන උතුර
හෝමාගම.